# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1724/23 – 2011 සැප්තැම්බර් 23 වැනි සිකුරාදා – 2011.09.23

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ යොමු අංකය: IR/13/26/2006.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඩී. කේ. දොඩන්ගොඩ මයා, නො. 167/4, හයිලෙවල් පාර, පන්නිපිටිය.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුල පාර, කොළඹ 05.

අතර පවත්නා ආරවුලක් පවතින හෙයින් ද

කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවවත්ත, නො. 114සී හි පී. දනන්සූරිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

1A – G 15101 – 355 (2011/09)

මගේ යොමු අංකය: IR/13/26/2006.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩී. කේ. දොඩන්ගොඩ මයා, 167/4, හයිලෙවල් පාර, පන්නිපිටිය.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුල පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ**

ශ්‍රී ලංකා ගමනනාගමන මණ්ඩලයේ 1963.01.01 සිට සේවය කර කළුතර මධ්‍යම අභ්‍යාස විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස 2006.06.02 දින විශ්‍රාම ගිය ඩී. කේ. දොඩන්ගොඩ මහතාට සේවයේ අවශ්‍යතාවය අනුව සේවය කිරීමට සිදුවීම නිසා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විධායක නිලධාරීන්ට විශ්‍රාම යාමේදී ලබා දෙන මාස 03 ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුව ලබා නොදීමෙන් හෝ ඒ සඳහා ගෙවීම නොකිරීමෙන් හා ඉතිරි වාර්ෂික නිවාඩු හා උපයා ගත් වාර්ෂික නිවාඩු සඳහා ගෙවීම් නොකිරීමෙන් යම් අසාධාරණයක් සිදුවීද, එසේ සිදුවී නම් ලැබිය යුතු සහන මොනවාද? කුමන ප්‍රමාණයකින්ද යන්න වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.
10 - 208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.